UPDF
WWW.UPDF.COM

ආයතනයේ නම : වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர் : வனவிலங்கு பாதுகாப்புத் துறை

நிலையியற் கட்டளையின் இலக்கம் 119 (4) இன்படி விதிமுறைகளில் பொது கணக்கு குழுவினால் வழங்கப்பட்ட அறிக்கைக்கு ஏற்ப எடுக்கப்பட்ட நடவடிக்கைகளும் மற்றும் கௌரவ அமைச்சர் அவர்களின் அவதானிப்புகளினதும் சமர்ப்பிப்பு

Name of the Institution: Department of wildlife Conservation

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119 (4)

UPDF
WWW.UPDF.COM

පාර්ලිමේන්තුවේ රජයේ ඉණුම් පිළිබඳ කාරක සභාව විසින් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ සභාගත කරන ලද වාර්තා සම්බන්ධ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු නියෝග අංකය - 290

ආයතනයේ නම - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

රාජ්‍ය ඉණුම් කාරක සභාව විසින් හඳුනා ගන්නා ලද අඩුපාඩු	ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වය
පළමු කොටස : 77.00	
2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ඉණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළමු , දෙවන සහ තුන්වන මුරපද තුන් මසකට වරක් වෙනස් කර නොතිබීම.	2024 වර්ෂයේ සිට වැටුප් සකස් කිරීමේ මුරපද තුන් මසකට වරක් වෙනස් කිරීමට කටයුතු කර ඇත.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබීම.	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව තුළ අංශ 16 ක් සහ කලාප කාර්යාල 12 ක් ස්ථාපිතව ඇති අතර, විගණන විමසුම් සඳහා පිළිතුරු සකස් කිරීමේදී සමහර අවස්ථාවල මෙම අංශ හා කලාප කාර්යාල වලින් ද තොරතුරු කැඳවිය යුතුවේ. එම තොරතුරු ලබා දීමේ ප්‍රමාදයන් පවතින සමහර අවස්ථාවල මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොලැබෙන අවස්ථා ඇතිවේ. එවැනි අවස්ථාවන්හිදී අවසන් වාර්තාව ඉදිරිපත් කරන තෙක් අතුරු පිළිතුරක් යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. එම කාල සීමාව තුල පැවති කොරෝනා වසංගතය හේතුවෙන් නිලධාරීන් සේවයට වාර්තා කිරීමේ සම්භාවිතාව අඩු වීම නිසා ද පසුගිය කාල වකවානුවේදී විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොතිබුණි.එහෙත් හැකි සෑම අවස්ථාවකම මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කිරීමට උත්සාහ දරන බව දන්වමි. මේ වනවිට සියළුම විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු සැපයීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබීම.	

UPDF
WWW.UPDF.COM

සසඳු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබීම.	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විෂය පථයට අනුව වනජීවී අපරාධ සම්බන්ධයෙන් පුද්ගලයින් අත්ඩංගුවට ගැනීම සහ නීති විරෝධී කටයුතු වැටලීම් හා විමර්ශන රාජකාරී ඉටු කරනු ලබයි. එබැවින් එම රාජකාරී සඳහා දෙපාර්තමේන්තුව සතු වාහන භාවිතා කිරීමට හැකිවන පරිදි රාජ්‍ය ලාංඡනය පින්තාරු නොකිරීමට කටයුතු කර ඇති අතර , අනෙකුත් සාමාන්‍ය රාජකාරී සඳහා යොදා ගැනීමේදී සෑම වාහනයකම දෙපාර්තමේන්තු නාම පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට කටයුතු සම්පාදනය කර ඇත.
වාහනයක් ගර්හිත වී මාස 8 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබීම.	2020 වර්ෂයේ දී අපහරණ කටයුතු කිරීම සිදු කරමින් පැවති අතර, රජයේ වාහන මිලදී ගැනීම සීමා කිරීම හේතුවෙන් සිදු කරමින් පැවති වාහන අපහරණ කටයුතු තාවකාලිකව නතර කරන ලදී. ඒ අනුව අලුත්වැඩියා කර නැවත ධාවනයට යොදා ගත හැකි වාහන හඳුනා ගෙන එයින් ඇතැම් වාහන අලුත්වැඩියා කර මේ වන විට රාජකාරී සඳහා යොදවා ගෙන ඇත. අලුත්වැඩියා කළ නොහැකි ඉතිරි වාහන අපහරණ වාහන හඳුනා ගැනීමේ විශේෂිත කමිටුව මගින් හඳුනා ගෙන අවසන් කර ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු වාහන තක්සේරු කිරීමේ කමිටුව වෙත ඉදිරිපත් කර ඇත.
රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබීම.	දෙපාර්තමේන්තුව සතුව වාහනවල සිදු වූ අනතුරු සම්බන්ධයෙන් මේ දක්වා කටයුතු නොකල වාහන අනතුරු 95 කට අධික ප්‍රමාණයක් තිබුණි. මේ වන විට එම අනතුරුවලින් 20 කට වැඩි ප්‍රමාණයක පරීක්ෂණ කටයුතු අවසන් කර ඇති අතර, ඉතිරි අනතුරු සම්බන්ධව ද මු.රෙ. 103, 104 පරීක්ෂණ මේ වන විට අවසන් අදියරේ පවති. ඇතැම් අනතුරු සිදු වී වසර 20 ක් පමණ වීම හේතුවෙන් එම අනතුරු සම්බන්ධයෙන් තොරතුරු සොයා ගැනීමට අපහසු වීම මත මෙම මු.රෙ. 104 (4) පරීක්ෂණ කටයුතු ප්‍රමාද වීමට හේතු වී ඇත. නමුත් වර්තමානයේ සිදු වූ අනතුරු සම්බන්ධව මෙවැනි තත්ත්වයක් උද්ගත වී නොමැති අතර, එම පරීක්ෂණ කඩිනමින් අවසන් කර ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබීම	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ශේෂයන් පරීක්ෂා කර බලා නිවැරදිව හඳුනා ගැනීමෙන් පසු නිරවුල් කිරීමට කටයුතු කර ඇත. නිවැරදිව හඳුනා ගැනීමට යම් කාලයක් ගතවන බැවින් මසක් තුල නිවැරදි කිරීමට නොහැකි වී ඇත.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන ණය ශේෂ පැවතීම	වර්ෂයකට වඩා වැඩි ණය ශේෂ වලින් 25,000/= ට අඩු ණය ශේෂ කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇති අතර, ඇතැම් ණය ශේෂ අයකර ගැනීමට ද කටයුතු කර ඇත. තව දුරටත් අයවිය යුතු ණය ශේෂයන් අයකර ගැනීම සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙතින් උරුමකරුවන් පිළිබඳව සහ වත්කම් පිළිබඳව තොරතුරු ලබා ගෙන නීතිපති උපදෙස් මත අවශ්‍ය ඉදිරි ක්‍රියා මාර්ග ගෙන ඇති බව දන්වමි.

UPDF
WWW.UPDF.COM

පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබීම	පොදු තැන්පත් ගිණුමේ වර්ෂ දෙක ඉක්මවා ඇති රජයේ ආදායමට බැර කල හැකි තැන්පතු හඳුනා ගෙන රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත. ව්‍යාපෘති සඳහා ලබා දී ඇති ඇතැම් තැන්පතු එම කාර්යයන් නිම වන තෙක් තව දුරටත් තබා ගැනීමට කටයුතු කර ඇත.
මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබීම.	අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කිරීමට නිලධාරීන් වෙත උපදෙස් ලබා දීමට කටයුතු කර ඇති අතර, හැකි සෑම අවස්ථාවකදීම තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාසයක් ඇතුළත නිරවුල් කිරීමට කටයුතු කරමි.
මු.රෙ.371 හි සීමාව ඉක්මවා තත් කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.	මාණ්ඩලික නිලධාරීන් සඳහා උපරිම රුපියල් 100,000 දක්වා අතුරු අග්‍රිම නිකුත් කිරීමටත් සෙසු නිලධාරීන් සඳහා උපරිම රුපියල් 20,000 ක සීමාවකට යටත්ව අතුරු අග්‍රිම ලබා දීමට කටයුතු කර ඇත.
දෙවැනි කොටස : 65.00	
ආයතනයේ පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබීම.	මේ වන විට ආයතනයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතර, ඒ තුළින් මහජනයාට පැමිණිලි හා ප්‍රශංසා සටහන් කිරීමට අවස්ථාව සලසා දීමට කටයුතු කරමි. එතෙක් දෙපාර්තමේන්තු සම්බන්ධීකරණ තොරතුරු වෙබ් අඩවියට ඇතුළත් කර ඇති අතර, හදිසි ඇමතුම් ලබා දීම සඳහා 1992 හදිසි ඇමතුම් අංකය පැය 24 පුරාම ක්‍රියාත්මක වේ.
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබීම	2021 වසරේ දී සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව කටයුතු කිරීමට සිදුවීම හේතුවෙන් කණ්ඩායම් වශයෙන් නිලධාරීන් රැස් කිරීමට නොහැකි වූ බැවින් 2021 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම ගැටළු සහගත විය. එහෙත් සියළුම පුහුණු වැඩ සටහන් අධ්‍යක්ෂ (මෙහෙයුම්) ගේ සෘජු අධීක්ෂණය යටතේ සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා පුහුණු) විසින් සැලසුම්ගත ක්‍රියාත්මක සැලැස්ම අනුව ක්‍රියාත්මක කිරීමට හැකිවූ වාර්ෂික පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.මේ වන විට මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කර ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම	2021 වර්ෂයේ දී එවකට නිකුත් කර තිබූ සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව කණ්ඩායම් ලෙස නිලධාරීන් රැස් කිරීමේ අපහසුතාවය හේතුවෙන් 2021 වර්ෂය සඳහා සැලසුම්ගතව ක්‍රියාත්මක කිරීමට තිබූ පුහුණු වැඩසටහන් සියල්ලම පැවැත්වීමට නොහැකිවීම හේතුවෙන් සැලසුම්ගත පුහුණු අවස්ථා

UPDF
WWW.UPDF.COM

ලෂයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබීම.	ප්‍රමාණය 50%ක පමණ මට්ටමක පවත්වා ඇත.නැවත යථා තත්ත්වයට පත් වීමෙන් පසුව පුහුණුවීම් කටයුතු නියමිත පරිදි සිදු කරමින් පවති
සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබීම.	සමස්ත කාර්ය මණ්ඩලයට අදාළව කාර්ය සාධන වාර්තා වාර්ෂිකව ලබා ගන්නා අතර, සේවයට බඳවා ගත් පසු පොදු 160 වැනි ආකෘති පත්‍රයෙන් නිලධාරියා ගිවිසුමකට එළඹේ.
මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු නම් කර නොතිබීම.	මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා පුහුණු කටයුතු සැලසුම් කිරීම සංවිධාන කටයුතු සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු ලෙස පර්යේෂණ හා පුහුණු අංශ ප්‍රධානියා පත් කර තිබුණි.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	2021 විගණකාධිපති වාර්තාව අනුව ආයතනයේ ගිණුම් පිළිබඳව ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ පවතින බවට මතයක් ඉදිරිපත් කර නොමැති අතර, විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති අඩුපාඩු වලින් වන බලපෑම හැර 2021 වර්ෂය සඳහා වූ මුල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවට තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇත. 2021 විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති අඩුපාඩු මේ වන විට නිවැරදි කර ඇත.
2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 වගන්තිය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිනුම් කළ හැකි කාර්යසාධන දර්ශක 03 ක් හඳුනා ගෙන නොතිබීම	2021 වර්ෂයේ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් කාර්යාලයේ නිලධාරීන් සීමිත පිරිසක් රාජකාරියට වාර්තා කරන ලද බැවින් අත්‍යාවශ්‍ය රාජකාරි කටයුතු ඉතා අසීරුවෙන් කළමනාකරණය කරගත් අතර ,මේ වන විට 02/2020 චක්‍රලේඛය පරිදි කාර්ය සාධන දර්ශක හඳුනා ගෙන එහි ප්‍රගතිය මැනීම සිදු කරනු ලැබේ.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබීම	2021 වර්ෂයේ විගණකාධිපති වාර්තාවට අදාළ නිර්දේශ මේ වන විට ක්‍රියාත්මක කර ඇත.

UPDF
WWW.UPDF.COM

...ගිණුම් කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොනිබීම	2021 වර්ෂයේ ගිණුම් කාරක සභා වාර්තාවට අදාළ නිර්දේශ මේ වන විට ක්‍රියාත්මක කර ඇත.

ගුණදාස සමරසිංහ
ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ලේකම්
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

Gunadasa Samarasinghe
Secretary
Ministry of Wildlife and Forest
Resources Conservation

එම්.ජී.සි.සූරියබණ්ඩාර
ගණන් දීමේ නිලධාරී/අධ්‍යක්ෂ ජනරාල්
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

එම්. ජී. සී. සූරියබණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
අංක. 811/ඒ. ජයන්තිපුර පාර
බත්තරමුල්ල